# ප්‍රවෘත්ති නිවේදනය
# ஊடக அறிக்கை
# PRESS RELEASE

- ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ සහ අපිත් සමඟ ඒකාබද්ධ වූ සියලුම පක්ෂ සමඟ ඒකාබද්ධ මැයි රැළිය බොරැල්ල කැම්බල් පිටියේදි.....................

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ පක්ෂයේ නායක පස්වන විධායක ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ නායකත්වය යටතේ සහ මහජන එක්සත් පෙරමුණ නායක ගරු අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මැතිතුමා ඇතුළු සියලුම පක්ෂ නායකයන්ගේ සහභාගීත්වයෙන් සාර්ථක මැයි දින රැළියක් බවට පත් කරලීමට කටයුතු සූදානම් කර ඇති බව පාර්ලිමේන්තු මන්ත්‍රී රෝහිත අබේගුණවර්ධන මහතා පැවසීය. ඒ මහතා මේ බව ප්‍රකාශ කළේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ පක්ෂ මූලස්ථානයේ අද දින (2023.04.28) පැවති ප්‍රවෘත්ති සාකච්ඡාවට එක්වෙමිනි.

එහිදි පාර්ලිමේන්තු මන්ත්‍රී රෝහිත අබේගුණවර්ධන මහතා,

"තව දින කිහිපයකින් ලෝකයේ වෙසෙන කම්කරුවන් සහ ශ්‍රී ලාංකික අපේ කම්කරු ජනතාවත් තමන්ගේ කම්කරු දිනය මැයි 01 දා ඒ වෙනුවෙන් සැමරීමට අවශ්‍ය කරන වැඩපිළිවෙළ සකස් වෙනවා. මේ මැයි දිනය කම්කරුවන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් ඔවුන්ට තමන්ගේ මත ප්‍රකාශ කිරීමට තිබෙන දිනයක්. පහුගිය අවුරුදු ගණනාව තුළ එනම් කොවිඩ් වසංගතය නිසා අපිට මැයි දිනය සමරන්න පුළුවන්කම ලැබුණේ නෑ. අනිත් පැත්තෙන් 2022 වර්ෂයේදි අරගලකරුවන් මේ රට එහෙම්පිටින්ම ඉතාම අසරණ තත්වයකට පත්කරපු නිසා මේ මැයි දිනය සැමරීමට පුළුවන්කමක් ලැබුණේ නෑ. නමුත් අද අපි ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ සහ අපිත් සමඟ ඒකාබද්ධ වුණු සියලුම පක්ෂ සමඟ ඒකාබද්ධ මැයි රැළිය බොරැල්ල කැම්බල් පිටියේදි පැවැත්වීමට කටයුතු මේ වන විට සූදානම්වෙමින් පවතිනවා. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ පක්ෂ නායක පස්වන විධායක ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ නායකත්වය යටතේ සහ ඒ වගේම මහජන එක්සත් පෙරමුණේ නායක ගරු අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මැතිතුමා ඇතුළු සියලුම පක්ෂ නායකයන්ගේ සහභාගීත්වයෙන් මේ මැයි දින රැළිය සාර්ථක මැයි දින රැළියක් බවට පත් කරන්න කටයුතු සූදානම් කර තිබෙනවා. විශේෂයෙන් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ හැටියට අපේ සියලුම වැඩකටයුතු අපේ පක්ෂයේ නිර්මාතෘ බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ උපදෙස් පරිදි ක්‍රියාත්මක වෙමින් පවතිනවා. අපි හැම දිස්ත්‍රික්කයක්ම , ලංකාවේ හැම මැතිවරණ කොට්ඨාශයක්ම ආවරණය කරමින් අපි කැම්බල්පිටියට අපේ පක්ෂයේ දැවැන්ත මැයි දින රැළියට සහභාගි කරවන්න අවශ්‍ය වැඩපිළිවෙළ සකස් කරලා තිබෙනවා. ඒ වෙනුවෙන් දිස්ත්‍රික් නායකතුමන්ලා, ආසන භාරව ඉන්න සංවිධායකතුමන්ලා ඇතුළු සියලුදෙනා එහි කැඳවීම සඳහා අවශ්‍ය වැඩපිළිවෙළ ශක්තිමත්ව කරගෙන යනවා. මේ අවස්ථාවේ අපි දකිනවා ලෝකයේ කම්කරු දිනය සමරන ගමන් ලංකාවේත් දැන් කම්කරු දිනය සැමරීම වෙනුවෙන් අවශ්‍ය වටපිටාව ඒ වගේම ප්‍රජාතන්ත්‍රවාදි වටපිටාවක් නිර්මාණය කිරීමට අතිගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාට අපේ කෘතවේදිභාවය ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ හැටියට අපි ප්‍රකාශ කරනවා. 1971, 1988,1989 මේ රටේ කැලෑ නීතිය තිබුණා. හැබැයි ඒ කැලෑ නීතිය ක්‍රියාත්මක වුණොත් රටේ ප්‍රජාතන්ත්‍රවාදය අහිමිවෙලා ත්‍රස්තවාදය ඉස්මතුවෙන ,රට කඩාකප්පල් කරන පිරිස් තමයි රටේ නීතිය අතට ගන්නේ. එවැනි තත්වයක් පහුගිය දවස් ටිකේ අපි දැක්කා. නමුත් රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා බොහෝම පැහැදිලිව මේ මැයි දිනය සමරන ඕනෑම පක්ෂයකට තමන්ට ප්‍රජාතන්ත්‍රවාදි ලෙස ඒ මැයි දිනය සමරන්න අවශ්‍ය කරන ඒ ප්‍රජාතන්ත්‍රවාදි රාමුව සහ ඒ සියලු කටයුතු රජය විසින් මේ වන විට ක්‍රියාත්මක කරනවා.

අදත් මේ මොහොතේත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සම්බන්ධයෙන් සාකච්ඡාවක් පාර්ලිමේන්තුවේ ක්‍රියාත්මක වෙනවා. දැන් මේ වන විට රට ස්ථාවරභාවයට පත්වෙමින් පවතිනවා. රට ස්ථාවරභාවයට පත්වෙනකොට අපි දකිනවා මේ IMF එකත් එක්ක ගණුදෙනුව කරන්නේ මේ රටේ ආර්ථිකය ශක්තිමත් කරගන්න. හැබැයි අපි හිතන්නේ නෑ මේ IMF එකෙන් ලැබෙන මුදල්වලින් සියල්ල කරන්න වෙයි කියලා. අපි උත්සහා කරන්නේ අපි යන්තම් මේ තියෙන තත්වයෙන් ඔළුව උස්සගන්න. ඊට පස්සේ අපිට සිදුවෙනවා නව ක්‍රමවේදයන් තුළ මේ රටට ආයෝජකයන් ගෙන්වා ගැනීම , අපේ කාර්යක්ෂමතාවය

වැඩිකරවා ගැනීම, අපනයන ක්ෂේත්‍රය ශක්තිමත් කරගැනීම මෙවායින් තමයි අපේ ආර්ථිකය නඟා සිටුවන්න පුළුවන් වෙන්නේ. දැන් තිබුණු තත්වයට වඩා ස්ථාවරභාවයකට පත්වෙනකොට අපිට පේනවා විපක්ෂය හැමදාම උත්සහ කරන්නේ කොයි දේ කෙරුවත් ඔවුන්ට කවදාවත් මොනදේවත් හොඳවියට දකින්න පුරුදුවෙලා නෑ. නමුත් ඔවුන්ගේ මේ උත්සහයන් තුළ අපිට පේනවා කිසිසේත්ම එය සාර්ථක වෙන්නේ නෑ. ඔවුන් හදන්නේ රට අස්ථාවර කරන්න. එයින් ඔවුන්ට අවශ්‍ය වෙන්නේ රට අස්ථාවර වුණාම ඒ විපක්ෂයට පුළුවන් ස්ථාවර වෙන්න. ඒ ස්ථාවරභාවය ඇති කරගන්න තමයි ඔවුන් අද කටයුතු කරන්නේ. ඒ නිසා අපි බොහෝම පැහැදිලිව කියනවා ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ප්‍රමුඛ සන්ධානගත මැයි දින රැළිය ලංකාවේ මැයි රැළිවලින් සාර්ථක රැළිය බවට මැයි 01 දා මේ 2023 අපි ක්‍රියාත්මක කරනවා. ”

එහිදී පාර්ලිමේන්තු මන්ත්‍රී සංජීව එදිරිමාන්න මහතා,

“ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ මෙවර ලෝක කම්කරු දිනය සැමරීම වෙනුවෙන් දැවැන්ත මැයි රැළියක් සංවිධානය කරලා තිබෙනවා. ඒ සඳහා වන සංවිධාන කටයුතු වෙනුවෙන් තමයි පක්ෂය මේ දින කිහිපය කේන්ද්‍රිය අවධානය යොමුකරලා තිබුණේ. එහි ආරම්භක අවස්ථාවක් විදිහට පසුගිය මාසයක පමණ කාලයක් පුරා පක්ෂයේ ආසන සම්මේලන දිවයිනේ ප්‍රදේශ කිහිපයක පවත්වලා ඊට අවශ්‍ය සංවිධාන කටයුතු සඳහා අවශ්‍ය සහයෝගය ලබාදෙමින් හිටියා. ඉන්පසු අපි ප්‍රාදේශීය සභා මට්ටමින්, පළාත් පාලන ආයතනයෙන් ආයතනය මැයි රැළිය සංවිධානය කිරීමට අවශ්‍ය කටයුතු මේ වන විට සාකච්ඡා කරලා තිබෙනවා.

ලෝක කම්කරු දිනය කියන්නේ ලෝක වැඩකරන ජනතාවගේ අයිතීන් දිනාගැනීම සඳහා වන සටන ලෝකය පුරා සංකේතාත්මකව ප්‍රදර්ශනාත්මකව ඉදිරිපත් වන දවස. නමුත් මීට දශක ගණනාවක සිට අයියානු දේශපාලන මැයි දිනය සමරුනු ලබන්නේ කම්කරු අයිතීන් දිනාගැනීමේ සටන පෙරටු කරගනිමින්. ඒ තුළ එක්තරා දේශපාලන කාරණාවකුත් සඳහන් වෙනවා. නමුත් යම් යම් දේශපාලන පක්ෂ තමන්ගේ දේශපාලන ශක්තිය ප්‍රදර්ශනය කරන අවස්ථාවක් විදිහටත් දිර්ඝකාලයක් තිස්සේ ලංකාවේ මැයි දිනය සංවිධාන වෙනවා. එය බොහෝම විවෘත අවස්ථාවක්. අපි සූදානම් ලංකාවේ මෙවර තිබෙන දැවැන්තම මැයි රැළිය බොරැල්ල කැම්බල් පිටියේ තියන්න . ඒ සඳහා අවශ්‍ය මූලික කටයුතු සංවිධානය කරලා තිබෙනවා. 2017 ඓතිහාසික මැයි රැළිය අප විසින් සංවිධානාත්මකව ගෝල්ෆේස් පිටියට කැඳවූ ලක්ෂ සංඛ්‍යාත පිරිසට අමතරව ඒ හා සමානව පිරිසක් තනි තනිව සහභාගි වුණා. මෙවරත් එවැනි ස්භාවික මහජන සහභාගීත්වයකුත් අපි අපේක්ෂා කරනවා. ඒ සියල්ල මැද්දේ අපි ඉතාම විවෘතව අපි ආරාධනා කරනවා ඔබටත් ඒ සඳහා සහභාගි වෙන්න. මහින්ද රාජපක්ෂ අපේ පක්ෂ නායකතුමාගේ ප්‍රධානත්වයෙන් මැයි රැළිය සංවිධානය කරන්නේ. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩු මේ රටේ වැඩකරන ජනයා වෙනුවෙන් වැඩිම අවස්ථා නිර්මාණය කළ, වැඩකරන ජනතාවගේ ගෞරවය උපරිමයෙන් දිනාගත්ත දේශපාලන නායකයා, එතුමන් වටා මේ රටේ වැඩකරන ජනතාව එකට එකතු කරගනිමින් අපි මෙවර මැයි දිනය සැමරීම සඳහා සූදානමින් සිටිනවා.”යනුවෙන් මෙහිදී සඳහන් කළෝ ය.

තිලක් තේනුවර,
මාධ්‍ය අංශ ප්‍රධානි,
මාධ්‍ය මධ්‍යස්ථානය,
ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ.